ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව.
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: **dcommunications@cbsl.lk, communications@cbsl.lk**
වෙබ් අඩවිය: **www.cbsl.gov.lk**

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2019 මැයි 15 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2019 අප්‍රේල්

2019 මාර්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 25.9 කින් පහළ යමින් මෙතෙක් වාර්තා කළ පහළම දර්ශක අගය වූ 41.0 ක් වාර්තා කරමින් 2019 අප්‍රේල් මාසයේදී නිෂ්පාදන ක්‍රියාකාරකම් පහළ යන ලදී. විශේෂයෙන්ම ආහාර හා පාන වර්ග සහ රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයන්හි නව ඇණවුම් සහ නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සිදුවූ සැලකිය යුතු අඩු වීම, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ මෙම පහළ යාමට හේතු විය. අප්‍රේල් මාසයේදී පැවති අලුත් අවුරුදු නිවාඩුව සහ පාස්කු ඉරිදා දින සිදුවූ ප්‍රහාරයෙන් පසු රටෙහි පැවති ආරක්ෂක වැඩ පිළිවෙළ කර්මාන්ත ශාලාවන්හි සුමට ක්‍රියාකාරීත්වය කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී. මේ හේතුවෙන්, කර්මාන්ත ශාලාවන්හි රාජකාරී වේලාවන් සීමා කිරීමට සිදුවීම, අපේක්ෂිත නිෂ්පාදන මට්ටම් ලඟාකර ගැනීමට නොහැකි වීමට හේතු වූ බව රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයෙහි බොහෝමයකගේ ප්‍රතිචාරය විය.

| විචලයය | මාර්තු | අප්‍රේල් | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **66.9** | **41.0** | **-** | **ඉහළ යෑමක සිට පහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ඇණවුම් | 75.8 | 37.5 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| නිෂ්පාදන | 74.2 | 32.5 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 57.1 | 43.5 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| ගැනුම් තොගය | 64.6 | 41.0 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 51.5 | 55.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අප්‍රේල් මාසයේ අලුත් අවුරුදු නිවාඩුවෙන් පසුව සැලකිය යුතු සේවක පිරිසක් සේවයට වාර්තා නොකිරීම, සේවා නියුක්තියෙහි සැලකිය යුතු අඩු වීමට හේතු විය. අලුත් අවුරුදු සමයේ නිමාව සමග නව ඇණවුම් වල සිදුවූ අඩු වීම සහ පෙර මාසයේ ලබා ගත් අමුද්‍රව්‍ය තොග ඉතිරිව පැවතීම හේතුවෙන් ගැනුම් තොගය අඩු විය. පාස්කු ඉරිදා දින සිදුවූ ප්‍රහාරයෙන් පසු තර කරන ලද ආරක්ෂක වැඩ පිළිවෙළ හේතුවෙන් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය වැඩි විය.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය හැර අනෙකුත් සියලුම උප දර්ශක, කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා අඩු අගයක් වාර්තා කළ අතර, 2019 මාර්තු මාසයට සාපේක්ෂව 2019 අප්‍රේල් මාසයේදී නිෂ්පාදන ක්‍රියාකාරකම් පහළ ගිය බව ඉන් පෙන්නුම් කරයි.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**41.0**

**2019 මාර්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 25.9 ක පහළ යාමකි.**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2019 මාර්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.2 කින් පහළ යමින් 2019 අප්‍රේල් මාසයේදී 50.3 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2019 අප්‍රේල් මාසයේදී, එක්සත් රාජධානිය, චීනය, ඉන්දියාව සහ රුසියාව නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයන්හි අඩුවීමක් පෙන්නුම් කළ අතර එක්සත් ජනපදය, යුරෝපා කලාපය සහ සිංගප්පූරුව වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2019 මැයි 15 වන දිනට*

[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

2019 අප්‍රේල් මාසයේ දී, සේවා අංශය 2019 මාර්තු මාසයට සාපේක්ෂව පහළ ගිය අතර නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය, නිම කිරීමට නියමිත කාර්යයන් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් යන උපදර්ශක සියල්ලෙහිම සිදු වූ පහළ යෑම ඊට හේතු විය. 2015 මැයි මස ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පිළිබඳ සමීක්ෂණය ඇරඹීමෙන් පසුව සේවා අංශයෙහි පහළ යෑමක් පෙන්නුම් කරමින් සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50 ට වඩා අඩු අගයක් වාර්තා කළ පළමු අවස්ථාව මෙයයි.

ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් පහළ යෑම සඳහා පාස්කු ඉරිදා සිදු වූ ප්‍රහාරය සහ රට තුළ පවතින අස්ථායිතාව මූලික වශයෙන් හේතු විය. ප්‍රධාන වශයෙන්, සංචාරකයන්ගේ පැමිණීම මත බොහෝ විට රඳා පවතින නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා සහ අනෙකුත් පෞද්ගලික සේවා උපඅංශ සහ රටෙහි දෛනික ක්‍රියාකාරකම් මත බොහෝ විට රඳා පවතින තොග සහ සිල්ලර වෙළඳාම සහ ප්‍රවාහන යන උපඅංශ ද ඇතුළත්ව සේවා අංශයෙහි උපඅංශ බහුතරයක මෙම තත්ත්වය දැකිය හැකි විය. ප්‍රතිචාර දක්වන්නන් විසින්, ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදු වූ පහළ යෑම සඳහා ඇඳිරි නීතිය පැනවීම හේතුවෙන් වැඩ කළ හැකි පැය ගණන සීමා වීම සහ තැති ගැනීම හේතුවෙන් කාර්ය මණ්ඩලයෙහි ඵලදායිතාව අඩු වීම හේතු වශයෙන් සඳහන් කර තිබුණි. කෙසේ වුවද, 2019 ජූනි මාසය වනවිට මෙම තත්ත්වය සාමාන්‍ය අතට පත් වේයැයි ඔවුන් අපේක්ෂා කරයි.

| විචල්‍යය | මාර්තු | අප්‍රේල් | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **56.3** | **45.3** | **-** | **ඉහළ යෑමක සිට පහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ව්‍යාපාර | 57.9 | 44.0 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 63.5 | 45.1 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 51.7 | 47.3 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 48.1 | 45.3 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 60.1 | 44.6 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| | | **අනෙකුත් දර්ශක** | | |
| අයකරන මිල ගණන් | 56.3 | 53.3 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| අපේක්ෂිත ශ්‍රම පිරිවැය | 70.5 | 62.6 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අලුත් අවුරුදු උත්සවයට අදාළව සිදු කරන ලද මිල ඉහළ දැමීම් හේතුවෙන් සේවා අංශයේ අයකරන මිල ගණන් 2019 අප්‍රේල් මාසයේ දී අඩු වේගයකින් ඉහළ යන ලදී. 2019 අප්‍රේල් මාසයේදී අපේක්ෂිත වැටුප් වර්ධන සාක්ෂාත් වීම හේතුවෙන් සේවා අංශයේ අපේක්ෂිත ශ්‍රම පිරිවැය ද අඩු වේගයකින් ඉහළ ගියේය.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**45.3**

**2019 මාර්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 11.0 ක පහළ යෑමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය සේවා අංශයෙහි නිමැවුම් වර්ධන වේගයෙහි අඩු වීමක් පෙන්නුම් කරමින් ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2019 මාර්තු මාසයේ දී වාර්තා වූ 53.7 හි සිට අප්‍රේල් මාසයේ දී 52.7 දක්වා පහළ යන ලදී. කෙසේ වුවද, පසුගිය මාස 117 තුළ ගෝලීය සේවා නිමැවුමෙහි වර්ධනයක් එමගින් පෙන්නුම් කරයි.

ජපානය, චීනය, ඉන්දියාව, එක්සත් රාජධානිය සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ 2019 මාර්තු මාසයට සාපේක්ෂව අප්‍රේල් මාසයේ දී වර්ධනය වූ බව පෙන්නුම් කරන ලදී.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2019 මැයි 14 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.